# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.09.13 පැය 1110 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/**1752 /25** | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**වාද්දූව තල්පිටිය ශ්‍රී දළදාවත්ත පුරාණ විහාරස්ථානයේ වාර්ෂික දළදා පෙරහර හේතුවෙන් රථවාහන ගමනා ගමනය සීමා කිරීම - වාද්දූව පොලිස් වසම.**

වාද්දූව තල්පිටිය ශ්‍රී දළදාවත්ත පුරාණ විහාරස්ථානය විසින් වාර්ෂිකව පවත්වනු ලබන දළදා පෙරහර 2025.09.13 වන අද දින වීථි සංචාරය කිරීමට නියමිතය.

මෙම පෙරහර අලි ඇතුන් ඇතුළු නර්තන කණ්ඩායම් වලින් සමන්විත අංග 100 කට ආසන්න ප්‍රමාණයක් පෙළගස්වා ඇති අතර පෙරහර නැරඹීම සඳහා විශාල බැතිමතුන් පිරිසකගේ පැමිණීම අපේක්ෂා කරනු ලබයි.

එබැවින්, මෙම පෙරහර 2025.09.13 වන දින රාත්‍රී 07.00 සිට 2025.09.14 වන දින අළුයම 01.00 දක්වා වීථි සංචාරය කරන කාලය තුළ වාද්දූව පොලිස් වසමේ කොළඹ - ගාල්ල ප්‍රධාන මාර්ගයේ දැඩි රථවාහන තදබදයක් ඇති විය හැකි බැවින් පහත විකල්ප මාර්ග භාවිතා කරන ලෙස පොලිසිය රථවාහන රියදුරන්ගෙන් හා මහජනතාවගෙන් ඉල්ලා සිටියි.

**විකල්ප මාර්ග**

- **කොළඹ සිට ගාල්ල දෙසට ගමන් ගන්නා රථවාහන -**
  පානදුර ඔරලෝසු කණුව අසළින් හොරණ පාරේ අළුබෝමුල්ල හරහා බණ්ඩාරගමට ගොස් බණ්ඩාරගම හන්දියෙන් ඇති දකුණට මොරොන්තුඩුව මාර්ගයේ ගොස් වාඩිය මංකඩ හන්දියෙන් වමට හැරී කළුතර හරහා ගාල්ල දෙසට ගමන් කළ හැකිය.

- **ගාල්ල සිට කොළඹ දෙසට ගමන් ගන්නා රථවාහන -**
  කළුතර උතුර පොලිස් වසමේ වාඩිය මංකඩ හන්දියෙන් දකුණට ඇති මොරොන්තුඩුව මාර්ගයේ බණ්ඩාරගම දක්වා ගමන් කර බණ්ඩාරගම හන්දියෙන් වමට හැරී අළුබෝමුල්ල හරහා පානදුර දෙසට ගොස් පානදුර ඔරලෝසු කණුව හන්දියෙන් දකුණට හැරී කොළඹ දෙසට ගමන් කළ හැකිය.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**